A

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පරීක්ෂණය-2019 පෙබරවාරි

## තුලනාත්මක අධ්‍යාපනය

**පැය තුනයි (03)**

**පළමුවන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද දෙවන කොටසින් අභිමත ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.**

---

## I - කොටස

**1.** පැරණි ශ්‍රී ලාංකීය දේශීය විශ්වවිද්‍යාලවල පිරිනමන ලද උපාධි හතරක් නම් කරන්න.

(ලකුණු 5)

**2.** සීගිරි ගී වලින් පැරණි ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ අධ්‍යාපන මට්ටම ගැන පැවසිය හැකි වන්නේ කුමක්ද?

(ලකුණු 5)

**3.** ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමන් ඉදිරිපත් කළ එච් 4 (H4) සංකල්පය යනු කුමක්ද?

(ලකුණු 5)

**4.** බ්‍රිතාන්‍ය යුගයේ ලංකාවේ පැවති යටත් විජිත අධ්‍යාපනයේ ප්‍රධාන අරමුණු පහක් දක්වන්න.

(ලකුණු 5)

**5.** අධ්‍යාපනයේ පාරිභෝගික ලක්ෂණ හා ආයෝජන ලක්ෂණ අතර වෙනස පෙන්වා දෙන්න.

(ලකුණු 5)

6. ඇමෙරිකානු පාසල් පද්ධතිය තුළ ඔබ හඳුනාගත් ගැටලු පහක් (5) දක්වන්න.

(ලකුණු 5)

7. වර්ෂ 1944 දී බ්‍රිතාන්‍ය අධ්‍යාපන පද්ධතියෙහි හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණ පහක් (5) කෙටියෙන් දක්වන්න.

(ලකුණු 5)

8. ප්‍රාථමික අධ්‍යාපනය නගා සිටුවීම සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් ගෙන ඇති පියවර පහක් (5) දක්වන්න.

(ලකුණු 5)

## II - කොටස

9. ශ්‍රී ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනය තුළ පැවති ප්‍රාථමික, ද්විතීක හා තෘතීක අධ්‍යාපන අවස්ථා වර්තමාන අධ්‍යාපන අවස්ථා සමග සසඳන්න.

(ලකුණු 20)

10. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා 1931 සිට ඉදිරිපත් කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා පැහැදිලි කරන්න.

(ලකුණු 20)

11. පහත සඳහන් මාතෘකා අතුරින් (02) <u>දෙකක්</u> පිළිබඳව සටහන් ලියන්න.

අ. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

ආ. 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව

ඇ. 2013 අ.පො.ස. උසස්පෙළ තාක්ෂණික විෂය ධාරාව

ඉ. ශ්‍රී ලංකාවේ තෘතීක අධ්‍යාපනයේ ගැටලු

(ලකුණු 10x2 = ලකුණු 20)

12. i. ෆෙඩ්රික් නෝත් හා රොබට් බ්‍රවුන්රිග් යන ආණ්ඩුකාරවරුන් ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ අනුගමනය කළ ක්‍රියාමාර්ග හා වෙනස්කම් සංසන්දනාත්මකව පෙන්වා දෙන්න.

(ලකුණු 10)

ii. කෝල්බෲක් කොමිසමේ හා මෝගන් කොමිසමේ යෝජනා අනුව ලංකාවේ අධ්‍යාපනයේ සිදු වූ වෙනස්කම් පෙන්වා දෙන්න.

(ලකුණු 10)

13. i. අධ්‍යාපනය ආර්ථික ප්‍රාග්ධනයක් ලෙස තහවුරු වූ ආකාරය පර්යේෂණ නිගමන ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා ආර්ථිකය අතර පවතින නොගැලපීම් හඳුන්වා, එම ගැටලුව විසඳා ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ලකුණු 10)

14. i. චීනයේ පාසල් පද්ධතිය නවීකරණය කිරීම සඳහා චීන අධ්‍යාපන බලධාරීන් මෑතකදී ගන්නා ලද ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය නවීකරණය කිරීම සඳහා ඉහත කී ක්‍රියාමාර්ග කොතෙක් දුරට යොදා ගත හැකි දැයි විමසන්න.

(ලකුණු 10)

15. i. 1944 දී බ්‍රිතාන්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්පාදනය සඳහා මුල් වූ බ්‍රිතාන්‍යයෙහි පැවති සමාජ ආර්ථික පසුබිම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. මහා බ්‍රිතාන්‍යයෙහි 1944 දී හඳුන්වා දුන් තුන් ඈඳුතු පාසල් ක්‍රමය විස්තරාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

16. i. බහු සංස්කෘතික අධ්‍යාපනය ප්‍රවේශයක් ලෙස භාෂාව යොදා ගන්නා ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

ii. විවිධ සංස්කෘතිවලට අයත් සිසුන්ට අධ්‍යාපනය ලබාදීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන බහු සංස්කෘතික අධ්‍යාපන ක්‍රියාමාර්ග සමග සංසන්දනය කරන්න.

(ලකුණු 10)

o∘o∘o∘o∘o∘o∘